**මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය - 2019.**

---------------------------------------------------------

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2006 ජනවාරි 16 දින එළඹි අංක 4138 - සීඊ දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------

සංවර්ධන ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කාර්යක්ෂම ජාතික මාර්ග පද්ධතියක තිරසාර බෙදාහැරීම මඟින් ප්‍රවාහන පිරිවැය අඩුකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ප්‍රථම සංවර්ධන ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 10,125 කට සමාන විගැහි මිලියන 69.10 (එජඩො මිලියන 100) ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යාණය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. තවද, රු.මිලියන 11,579 කට සමාන විගැහි මිලියන 59.60 (එජඩො මිලියන 98.1) ක අතිරේක වෙන් කිරීමක් 2008 ජුනි 23 දින එළඹි පළමු අතිරේක සංවර්ධන ණය ගිවිසුම යටතේ සපයා තිබුණි. 2011 මාර්තු 15 දින දෙවන අතිරේක සංවර්ධන ණය ගිවිසුමට එළඹි අතර රු.මිලියන 11,081 කට සමාන විහැගි මිලියන 63.6 (එජඩො මිලියන 100) ක අතිරේක වෙන්කිරීමක් එමඟින් කර තිබුණි. ආරම්භයේදී, ව්‍යාපෘතිය එහි කටයුතු 2006 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර 2011 මාර්තු 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. තවද, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2015 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ මෙහෙයුම් අඛණ්ඩව සිදුකර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

------------------------------

මාගේ මතය, මෙම වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම ,මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියලු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද ජාතික, පළාත් සහ ග්‍රාමීය මාර්ගවල පුනරුත්ථාපන සහ නැවත ඉදිකිරීම් කටයුතු අවසන් කර ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණද ව්‍යාපෘතියේ මෙහෙයුම් අවසන් කිරීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් අවශ්‍ය උපදෙස් ලබාදී නොතිබුණි. කෙසේවෙතත්, ගාල්ල - දෙනියාය මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු මත කොන්ත්‍රාත්කරු විසින් නිර්මිත රු.මිලියන 67.69 ක හිමිකම් නිරවුල් කිරීම පිළිබඳ මතභේදය 2019 දෙසැම්බර් 31 වන විටත් නොවිසඳී පැවතුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුචිත ලෙස භාවිතා කිරීම. | සත්‍ය වටිනාකම තවමත් නිශ්චිත නොමැති අතර මසක් තුළ නොවිසඳුනු මතභේදය පිළිබඳ වගකීම් පෙන්වමින් අවසාන කිරීමේ ගිණුම් සකස් කිරීමට පියවර ගනු ලැබේ. | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ මෙහෙයුම් අවසන් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

## 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

ලැබී තිබුණු තොරතුරු අනුව ව්‍යාපෘතිය විසින් පළාත් 08 ක ජාතික මාර්ගවල කිලෝමීටර් 620 ක් සහ පළාත් සභා 03 ක් සහ ප්‍රාදේශීය සභා 09 ක් යටතේ පවතින පළාත් සහ ග්‍රාමීය මාර්ගවල කිලෝමීටර් 635 ක් පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, 2015 ජුනි 30 දිනට ජාතික මාර්ගවල කිලෝමීටර් 685 ක සහ පළාත් සහ ග්‍රාමීය මාර්ගවල කිලෝමීටර් 162 ක

පුනරුත්ථාපනය කිරීමේ කටයුතු අවසන් කර තිබුණි. පළාත් සහ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 473 ක් නිමකර නොතිබුණ අතර මාර්ග 11 ක පුනරුත්ථාපන හා නඩත්තු කටයුතු වසරකට වඩා වැඩි ප්‍රමාදයක් සහිතවද අනෙකුත් මාර්ග 05 ක පුනරුත්ථාපන වැඩ දින 200 කට වඩා ප්‍රමාද වී අවසන්කර තිබූ බව නිරීක්ෂණය විය. තවද, විෂය පථය වෙනස් වීම්, විචලනයන් සහ අතිරේක වැඩ ආදිය හේතුවෙන් ඉහත සඳහන් කළ මාර්ගයන්හි පුනරුත්ථාපන කටයුතු සඳහා රු.මිලියන 14,816 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 22,065 දක්වා වැඩකරන අවස්ථාවේදී ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 48.92 ක් නියෝජනය කරමින් ඉහළ ගොස් තිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංක | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ඉංගිරිය - රත්නපුර මාර්ගයේ කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කිරීම සහ ව්‍යාපෘතිය දීර්ඝ කිරීම, කඩිනම් කිරීම සහ වෙනත් අරමුණු මත දරන ලද පිරිවැය සඳහා එකතුව රු.මිලියන 733.87 ක් ඉල්ලා තිබුණි. ඊට අමතරව කොන්ත්‍රාත්කරු විසින් පොළිය සඳහා එකතුව රු.මිලියන 903.1 ක හිමිකම් ඉල්ලා තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව, අමාත්‍ය මණ්ඩලය 2019 ඔක්තෝබර් 16 දින පැවති එහි රැස්වීමේදී අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් සම්පූර්ණ වටිනාකම අයකර ගැනීමට යටත්ව අදාල කොන්ත්‍රාත්කරුට සියයට 15 ක එකතුකල අගය මත බද්ද ඇතුළුව එකතුව රු.මිලියන 1,150 ක් ගෙවා හිමිකම් නිරවුල් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, අතිරේක පිරිවැය සඳහා වගකිවයුතු පාර්ශවයන් විමර්ශනය කිරීමට සහ අනාගත ව්‍යාපෘතිවල එවැනි අතිරේක පිරිවැය වලක්වා | අතිරේක පිරිවැයක් දැරීම. | වකවිකූ ඉදිකිරීම් සමාගම වෙත සියයට 15 ක එකතුකල අගය මත බද්ද ඇතුළුව (රු.මිලියන 1,150) රු.මිලියන 1,000 ක් වන අවසන් ගෙවීම 2019 ඔක්තෝබර් 31 දින ගෙවා ඇති අතර එදිනම වගකීමෙන් නිදහස් කිරීමේ ලිපිය අප වෙත ලැබුණි. 2019 ඔක්තෝබර් 09 දිනැති අංක 192683/119/095 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් මත අතිරේක පිරිවැය සඳහා වගකිව යුතු පාර්ශවය විමර්ශනය කිරීමට සහ අනාගත ව්‍යාපෘති වල එවැනි අතිරේක පිරිවැය වලක්වා ගැනීම සඳහා උපායමාර්ග සකස් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටුවක් පත්කර ඇත. | අතිරේක පිරිවැය සඳහා වගකිව යුතු පාර්ශවය සහ හේතු විමර්ශනය කිරීම සහ අනාගතයේදී එවැනි අතිරේක පිරිවැය වලක්වා ගැනීමට උපායමාර්ග සකස් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීම සඳහා උපායමාර්ග සකස් කිරීමට මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටුවක් පත්කර තිබුණි. කෙසේවෙතත්, අලාභය සඳහා වගකිවයුතු පාර්ශවයන් සොයා ගැනීමේ විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳව විගණනයට වාර්තාකර නොතිබුණි. | | | |
| (ආ) | ගාල්ල - දෙනියාය මාර්ගය පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා වන ගෙවීම් නිරවුල් කිරීම පිළිබඳ මතභේදය 2010 දී පැනනැගිණි. කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් සාමකාමී නිරවුල්කරන කමිටුවක් පත්කර තිබූ අතර ගෙවීම් නිරවුල් කිරීම සඳහා රු.මිලියන 67.69 ක් සහ එජඩො 858,017.28 ක් ගෙවීමට නිර්දේශකර ඇත. අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීමේ ප්‍රතිඵලයක් ලෙස, බේරුම්කරණය සමඟ ඉදිරියට යාමට ඔවුන් අදහස් කරන බවට කොන්ත්‍රාත්කරුගේ නීති උපදේශක දැනුම් දී ඇත. කෙසේවෙතත්, හිමිකම්පාන්නා විසින් ප්‍රකාශ කර ඇති රු.මිලියන1,897 ක මතභේදාත්මක වටිනාකම සම්බන්ධයෙන් සාධාරණ වටිනාකමක් සඳහා 2020 ජූලි 31 තෙක් සාකච්ඡාකර නොතිබුණි. සාමකාමී නිරවුල්කරනයකට එළඹීමකින් තොරව කොන්ත්‍රාත්කරුට ඇති වගකීම තවමත් පවතී. | අතිරේක පිරිවැයක් දැරීමට හැකියාව. | මෙම ගෙවීම් සිදුකිරීමට ලෝක බැංකු අරමුදල් නොමැති අතර නිරවුල් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ අරමුදල් භාවිතා කලයුතු බැවින් මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙකුගෙන් යුත් කමිටුවක් පත්කිරීමට අමාත්‍යාංශය පියවරගෙන තිබුණි. | අලාභය අවම කිරීමට පියවර ගත යුතුය. |